# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/37 - 2020 ඔක්තෝබර් මස 07 වැනි බදාදා - 2020.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට කළුගඟ ජල සම්පාදන ක්‍රම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ බණ්ඩාරගම භූගත ජලාශය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5-2/KT/10

1A - G 33078 — 63 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 663/B, බණ්ඩාරගම - බටහිර ග්‍රාම නිලධාරී වසමේ, මස්විල ගමේ පිහිටි දවටගහකනත්ත නොහොත් දවල්ගහකනත්ත නමැති සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක Ka/BAN/ 19/683 දරන ප්‍රගමණ අනුරේඛනයේ කැබලි අක්ෂර A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1898 (පර්චස් 75)ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | හිමිකම් කියන්නා සොයාගත නොහැකි බොල්ගොඩ වෙල්යාය ; |
| *නැගෙනහිරට* | : | කේ. අමරදාස සහ පී. ඩී. සී. පෙරේරා හිමිකම් කියන දවටගහකනත්ත නොහොත් දවල්ගහකනත්ත සහ කැබලි අක්ෂර B ; |
| *දකුණට* | : | කැබලි අක්ෂර B සහ ඒ. කේ. රත්නායක හිමිකම් කියන දවටගහකනත්ත ; |
| *බටහිරට* | : | ඒ. කේ. රත්නායක සහ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව හිමිකම් කියන දවටගහකනත්ත සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි බොල්ගොඩ වෙල්යාය. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : හේනාදීර ආරච්චිගේ චන්ද්‍රාවතී පෙරේරා මිය සහ තවත් අය,
රඹුක්කන,
බණ්ඩාරගම.

10 - 848

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට යෝජිත මොරවක ජල සම්පාදන ක්‍රමය යටතේ ඉදිකරන භූගත ජල ටාංකය හා පොම්පාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5-2/MH/11

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ. කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 242B, ඉළුක්පිටිය ග්‍රාම නිලධාරී වසමේ ඉළුක්පිටිය ගමේ පිහිටි ගම්සභා පාර නමැති ප්‍රවේශ මාර්ග කොටසින් පර්චස් 04ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගම්සභා පාර සහ පාර රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | කේ. කිරිගෝරිස් මයා හිමිකම් කියන ඉඩම ; |

*දකුණට* : සෝමපාල කළුආරච්චි මයා හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : ජේ. එල්. ප්‍රේමාවතී මිය හිමිකම් කියන ඉඩම සමග ඉළුක්කුඹුර පාසැල් පාර.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. සෝමපාල කළුආරච්චි මයා,
ගල්දොල,
කොටපොල.

10 - 849

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, මාතලේ ජල පවිත්‍රාගාරය ඉදි කිරීම සඳහා අතිරේක ඉඩම් කොටස් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/KY/12

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E 352 H, ඔය පහළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඔය පහළ (පාලම පාර කොටස) ගමේ පිහිටි, කැබලි අංක 01 සහ 02 වශයෙන් දැක්වෙන "ජම්බුගහවත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 83.25ක් පමණ වන ඉඩම් කොටස් දෙක :

කැබලි අංක : 01
ඉඩමේ නම : ජම්බුගහවත්ත
ප්‍රමාණය : පර්චස් 3.25

මායිම් :

*උතුරට* : එම්. එස්. ෆාතිමා ෂාදියා හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : එම්. අයි. එච්. ඉනූන් හිමිකම් කියන දෙකිද වත්ත ඉඩම ;
*දකුණට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම හ එච්. ඒ. එම්. හරිසා හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම සහ වතු පාර.

කැබලි අංක : 02
ඉඩමේ නම : ජම්බුගහවත්ත
ප්‍රමාණය : පර්චස් 80

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම්. එස්. ෆාතිමා ෂාදියා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | එම්. අයි. එච්. ඉනූන් හා සබානෝනා හිමිකම් කියන දෙකිද වත්ත ඉඩම ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම ; |
| *බටහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : කැබලි අංක 01

1. එම්. එස්. ෆාතිමා මහත්මිය,
25/80/09, ඔය පහළ,
මාතලේ.

කැබලි අංක 02,

2. එච්. ඒ. එම්. හරීසා මහත්මිය,
167, ගොඩපල පාර,
මාතලේ.

10 - 850

---

## 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට ඉමදුව ජල සම්පාදන ක්‍රමය යටතේ ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්තර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5-2/GL/13

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 175 C, ගොඩඋඩ මණ්ඩිය ග්‍රාම නිලධාරි වසමෙ, හවුපේ ගමේ පිහිටි වැකන්දෙනිය ගොඩවත්ත නමැති ඉඩමෙන් පර්චස් 15ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාරගහවත්ත පාර ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : එස්. කේ. පරණවිතාන මයා,
අංක 229, "ලීලානි",
හවුපේ

10 - 851

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.